# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1418/27 – 2005 නොවැම්බර් 10 වැනි බ්‍රහස්පතින්දා – 2005.11.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. ඕ. 3/92 II

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත**

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 34 වැනි වගන්තිය සමහ කියවිය යුතු 64 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වභාව සම්පත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඒ. එච්. එම්. ෆවුසි,
පරිසර හා ස්වභාව සම්පත් අමාත්‍ය.

2005 ඔක්තෝබර් මස 28 වැනි දින දී ය.

නියෝග

1997 ජනවාරි 10 වැනි දින අංක 958 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත, 1993 නොවැම්බර් 26 වැනි දින අංක 794/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1993 අංක 01 දරන, පතල් කැනීම් (බලපත්‍ර දීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

1. 3 වන නියෝගය-

(අ) ඒ නියෝගයේ (1) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) (i) ශිල්පීය කැනීම් බලපත්‍රයක් සඳහා හෝ ඒ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක්-

(අ) කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලයට හෝ ඒ ශිල්පීය පතල පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක බල ප්‍රදේශය ඇතුළත ද ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින කාර්යාංශයේ නාමෝද්දිෂ්ට නිලධරයකු වෙත හෝ ;

(ආ) කර්යාංශයේ යම් නාමෝද්දිෂ්ට නිලධරයකු වෙත එවකට පවත්නා ශිල්පීය කැණීම් වැඩ බිමකදී හෝ කාර්යාංශයේ ලියාපදිංචි කාර්යාලයේ දී හෝ භාරදිය හැකි ය.

(ii) (අ) ශිල්පීය කැණීම් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් මෙහි අංක 1 ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය ;

(ආ) එම බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක්, මෙහි 1:1 ආකෘතිපත්‍රයට සාරානුකූල විය යුතුය ;

(ආ) ඒ නියෝගයේ (4) වන ඡේදයේ "ප්‍රාදේශීය ලේකම්වරයා" යන වචනය වෙනුවට "භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රාදේශීය කළමනාකරු හෝ ප්‍රාදේශීය කාර්යාලය භාර නිලධාරියා" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(ඇ) ඒ නියෝගයේ (6) වන ඡේදයේ 'අ' වර්ගය යටතේ (II) වන අයිතමයේ " ඝන මීටර 100 කට නොඅඩු විය යුතු අතර ඝන මීටර 600 කට නොවැඩි විය යුතු ය" යන වචන වෙනුවට "ඝන මීටර 600 කට නොවැඩි විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

2. 4 වන නියෝගය

(අ) ඒ නියෝගයේ (4) වන ඡේදයේ "හැඳින්වීමේ ක්‍රමය" යන වචන වෙනුවට "ඉල්ලුම්පත්‍රයේ ලැයිස්තුගත මෙට්‍රික් ග්‍රීඩ් ඒකකවලට යාවන එකම සීමාවක් හෝ මායිමක් සහිත විය යුතු අතර හැඳින්වීමේ ක්‍රමය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ නියෝගයේ (8) වැනි ඡේදයේ "දවස් තිහක" යන වචන වෙනුවට "දවස් හතලිස්පහක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ නියෝගයේ 10 වැනි ඡේදයේ "සෑම අවුරුදු දෙකකම"යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා කොටස ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

වලංගු කාලය අවසානයට පෙර අලුත් කිරීම පිණිස අනුමතය සඳහා කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. ඉටු කළ පිළිගත හැකි කටයුතුවල අවම වාර්ෂික වටිනාකම පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) ගවේෂණ ප්‍රදේශය වර්ග කිලෝමීටර 64 ක් නොඉක්මවන ගවේෂණ බලපත්‍රයක් සඳහා-

| *අදාළ වර්ෂය* | *වර්ෂයකට වර්ග කිලෝමීටරයක් සඳහා අගය*<br>*රු. ශත* |
|---|---|
| 1. සහ 2 | 20,00,0.00 |
| 3 | 40,000.00 |
| 4 | 80,000.00 |
| 5 | 1,00,000.00 |

(ආ) ගවේෂණ ප්‍රදේශය වර්ග කිලෝමීටර 64 ක් ඉක්මවන ගවේෂණ බලපත්‍රයක් සඳහා-

| *අදාළ වර්ෂය* | *වර්ෂයකට වර්ග කිලෝමීටරයක් සඳහා අගය*<br>*රු. ශත* |
|---|---|
| 1. සහ 2 | 10,00,0.00 |
| 3 සහ 4 | 20,000.00 |
| 5 සහ 6 | 40,000.00 |
| 7 සහ 8 | 80,000.00 |
| 9 සහ 10 | 1,60,000.00 |

(ඇ) ඒ නියෝගයේ (II) වන ඡේදයේ "දැවුරුදු කාලසීමාව ඇතුළත ඉදිරිපත් කලහොත්, ඒ ගවේෂණ බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමේදී එම වැඩ ඊළඟ දැවුරුදු කාලසීමාව වෙනුවෙන් බැර කිරීම සඳහා ඉදිරියට ගෙන යා හැකිය" යන වචන වෙනුවට "ඒ බලපත්‍රය වලංගු කාලසීමාව ඇතුළත ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ ගවේෂණ බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමේදී එම වැඩ, ඒ බලපත්‍රයේ ඊළඟ කාලසීමාව වෙනුවෙන් බැර කිරීම සඳහා ඉදිරියට ගෙන යා හැකිය." යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ නියෝගයේ (12) වන ඡේදය ඉවත් කිරීමෙන් ;

(ඊ) ඒ නියෝගයේ (13) හා (14) වන ඡේද (12) වන හා (13) වන ඡේද ලෙස නැවත අංක යෙදීමෙන් ;

(උ) ඒ නියෝගයේ නැවත අංක යෙදූ (12) වන ඡේදයේ "දැවුරුදු" යන වචන වෙනුවට "වලංගු" යන වචන ආදේශ කිරීමෙන් ;

3. 5 වන නියෝගයේ :-

(අ) ඒ නියෝගයේ (1) වන ඡේදයේ-

(i) (ආ) අනුඡේදයේ "කාර්මික පතල් කැණීම් බලපත්‍රයක්" යන වචන වෙනුවට 'අ' හෝ 'ආ' වර්ගයේ කාර්මික පතල් කැණීම් බලපත්‍රයක් යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) "ඇ" වර්ගයේ බලපත්‍රයක් අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් මෙහි 3.2 '(අ)' ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය" යන අනුඡේදය ඇතුළත් කිරීමෙන් ;

(iii) (ඇ) අනුඡේදයේ "කාර්මික පතල් කැණීම් බලපත්‍රයක් පැවරීම" යන වචන වෙනුවට 'අ' හෝ 'ආ' වර්ගයේ කාර්මික පතල් කැණීම් බලපත්‍රයක් පැවරීම යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ නියෝගයේ (4) වන ඡේදයේ-

(i) (අ) සහ (ආ) අනුඡේද ඒ ඡේදයේ (ආ) සහ (ඇ) අනුඡේද ලෙස නැවත අක්ෂර යෙදීමෙන්,

(ii) අලුතින් අක්ෂර යෙදූ (ආ) අනුඡේදයට පෙරාතුවම මෙහි පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් ;

"(අ) 'ඇ' වර්ගයේ කාර්මික කැණීම් බලපත්‍රයක්, අලුත් කරනු ලැබීමට යටත් ව, එක් අවුරුද්දක් නොඉක්මවන කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය." ;

(iii) අලුතින් අක්ෂර යෙදූ (ආ) අනුඡේදයේ "කාර්මික පතල් කැණීම් බලපත්‍රයක්" යන වචන වෙනුවට 'අ' හෝ 'ආ' වර්ගයේ කාර්මික පතල් කැණීම් බලපත්‍රයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ නියෝගයේ (5) වන ඡේදයේ :-

(i) "අලුත්කිරීම, පැවරීම, උරුමකර ගැනීම හෝ" යන වචන වෙනුවට "අලුත් කිරීම හෝ පැවරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ඡේදයේ "කාර්මික පතල් කැණීම් බලපත්‍රයක්" යන වචන යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට 'අ' හෝ 'ආ' වර්ගයේ කාර්මික පතල් කැණීම් බලපත්‍රයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ නියෝගයේ (6) වන ඡේදයේ :-

(අ) 'අ' වර්ගය යටතේ-

(i) (1) වන විෂයාංකයේ "පිපිරවීමේ ක්‍රමය" යන වචන වෙනුවට "අධි බලැති පුපුරණ ද්‍රව්‍ය යොදා පිපිරවීමේ ක්‍රමය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (IV) වන අයිතමයේ "ෆ්‍රන්ට්වින්ඩ් ලෝඩර්" යන වචනය වෙනුවට ෆ්‍රන්ට්එන්ඩ් ලෝඩර්, එක්ස්කැවේටර්, ඩ්‍රෙජර් යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ නියෝගයේ "(ආ)" වර්ගය යටතේ-

(i) එහි (i) වන විෂයාංකයේ, "තනි බෝර සිදුරක" යන වචන වෙනුවට තනි බෝර සිදුරක අධිබලැති පුපුරණ ද්‍රව්‍ය හෝ බහු බෝර සිදුරු සහිත බෝර වලවල් ඩෙටොනේට් කෝඩ් හෝ අධිබලැති නොවන පිපිරවුම් ක්‍රම මගින් අව බලැති පුපුරණ ද්‍රව්‍ය යොදා වෙඩි පිපිරවීම ;

(ii) එහි (III) වන විෂයාංකය වෙනුවට පහත දැක්වෙන විෂයාංකය ආදේශ කිරීමෙන් :-

"(III) නිෂ්පාදන පරිමාව මසකට ඝන මීටර 1500 ට නොවැඩි විය යුතු ය ; " ;

(iii) එහි (IV) වන විෂයාංකයේ "ජැක් හැමර් පමණක්" යන වචන වෙනුවට "ජැක් හැමර්, රොක් බ්‍රේකර්ස්, ෆ්‍රන්ට් එන්ඩ් ලෝඩර්ස් සහ එක්ස්කැවේටර්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ නියෝගයේ (7) වන ඡේදයේ, "කාර්මික කැණීම් බලපත්‍රයක් ප්‍රදානය කර" යන වචන වෙනුවට" 'අ' වර්ගයේ කාර්මික පතල් කැණීම් බලපත්‍රයක් ප්‍රදානය කර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) ඒ නියෝගයේ (8) වන ඡේදයේ "(1) වන ඡේදයේ (අ) අනුඡේදයෙහි සහ (2) වැනි ඡේදයෙහි සඳහන් ගවේෂණ බලපත්‍ර අවශ්‍යතාව" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(i) (1) වන ඡේදයේ (අ) අනුඡේදයේ සහ (2) වැනි ඡේදයේ සඳහන් ගවේෂණ බලපත්‍ර අවශ්‍යතාව ;

(ii) ඉල්ලුම්පත්‍රය (1) වන ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් කාර්යාංශයේ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව" ;

4. 6 වන නියෝගයේ (5) වන ඡේදයේ, "කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයකට වලංගු වන අතර" යන වචන වෙනුවට "අලුත් කරනු ලැබීමට යටත්ව අවුරුද්දකට නොවැඩි කාලයකට වලංගු වන අතර" යන වචන ආදේශ කිරීමෙන් ;

5. 9 වන නියෝගයේ -

(අ) (1) (අ) අනුඡේදයේ "කාර්යාංශයේ ලියාපදිංචි කාර්යාලය වෙත හෝ අදාළ ඛණිජ ද්‍රව්‍ය සහිත දෙය හෝ ඛණිජ ද්‍රව්‍ය ඇත්තේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක බල ප්‍රදේශය ඇතුළත ද ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත" යන වචන වෙනුවට "කාර්යාංශයේ කලාපීය කාර්යාලය වෙත හෝ කාර්යාංශයේ නාමොද්දිෂ්ට නිලධරයකු වෙත හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ අදාළ ඛණිජ ද්‍රව්‍ය සහිත දෙය හෝ ඛණිජ ද්‍රව්‍ය ඇත්තේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක බල ප්‍රදේශය ඇතුළ ද ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ නියෝගයේ (2) වැනි අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :-

" (3) ඛණිජ ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍රයක සඳහන් ඛණිජ ද්‍රව්‍ය හෝ ඛණිජ ද්‍රව්‍ය සහිත දෙය ඛණිජ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යයේදී එම ප්‍රවාහන බලපත්‍රධාරියා හෝ ඔහුගේ අනුයෝජිතයාගේ සන්තකයෙහි, තත්කාර්යය සඳහා නිකුත් කරන ලද ප්‍රවාහන බලපත්‍රයේ මුල් පිටපත තිබිය යුතු ය." ;

6. 11 වන නියෝගයේ -

(අ) (1) වැනි හා (2) වැනි අනුඡේද එහි (2) වැනි හා (3) වැනි අනුඡේද ලෙස පිළිවෙලින් නැවත අංක යෙදීමෙන් ;

(ආ) නැවත අංක යෙදූ (2) වැනි අනුඡේදයට පෙරාතුවම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

" (1) ගවේෂණ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ දින සිට, ප්‍රථම මාස තුන ඇතුළත, බලපත්‍රධාරියා විසින් කාර්යාංශය වෙත, බලපත්‍රයේ කාලය ඇතුළත සෑම මාස තුනක කාලයක් සඳහා ම සැලසුම් කර තිබෙන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර දැක්වෙන වැඩ සැලැස්මක් සැපයිය යුතුය. එම වැඩ විස්තරය ඉන්පසුව ඒ බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් සමඟම ඉදිරිපත් කළ යුතු ය." ;

(ඇ) ඒ නියෝගයේ නැවත අංක යෙදූ (3) වැනි අනුඡේදයේ "දිනයට පූර්වයෙන් එනම් දෙවන, සිව්වන, සවන සහ අටවන වර්ෂාවසාන දිනවලට පූර්වයෙන්", "යන වචන වෙනුවට" "දිනයට පූර්වයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

7. 13 වන නියෝගයේ, (1) වැනි (2) වන හා (3) වැනි ඡේදවල "කාර්මික පතල් කැණීම් බලපත්‍රය" යන වචන යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට" "'අ' හෝ 'ආ' වර්ගයේ පතල් කැණීම් බලපත්‍රය" යන වචන ආදේශ කිරීමෙන් ;

3. 14 වන නියෝගයේ "අවශ්‍ය ලියවිල්ලක් විය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්,

"අවශ්‍ය ලියවිල්ලක් විය යුතු ය :

එසේ වුවද, මේ නියෝගයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, එවැනි බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් සමග අංක 12 දරන ආකෘතිපත්‍රය ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව, කාර්යාංශය විසින් නිශ්චිතව නියම කරන ඛණිජ ද්‍රව්‍ය ගණ සඳහා, කාර්යාංශය විසින් එහි අභිමතය පරිදි අතහැර දමනු ලැබිය හැකි ය." ;

9. 32 වන නියෝගයේ, (1) වන ඡේදයේ (ආ) අනුඡේදයේ "විකිණීමට" යන වචනය වෙනුවට, "විකිණීමට හෝ අපනයනය කිරීමට" යන වචන ආදේශ කිරීමෙන් ;

10. 33 වන නියෝගයේ-

(අ) (1) වන අනුඡේදයේ "මෙහි අංක" යන වචන වෙනුවට "1.1 ආකෘති පත්‍රයේ සහ 3.2 (අ) 13 සහ 14 දරන ආකෘති පත්‍රයේ නිශ්චිතව දැක්වෙන පරිදි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (2) වැනි ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන (2) වැනි ඡේදය ආදේශ කිරීමෙන් :

"(2) (අ) 32 වැනි නියෝගයේ (1) වැනි ඡේදයේ නිශ්චිතව දැක්වෙන පරිදි රාජ්‍යභාග ගෙවීමට යටත් බලපත්‍රලාභියකු හෝ අපනයනකරුවකු විසින්, ඒ සඳහා බලපත්‍රයක් මඟුව නිකුත් කරනු ලැබීමට ප්‍රථම, ඒ බලපත්‍රය යටතේ ගෙවිය යුතු රාජ්‍යභාග වෙනුවෙන් "රාජ්‍යභාග අත්තිකාරම් ගෙවීමක්" කළ යුතු ය :

එසේ වුව ද බලපත්‍රයේ ප්‍රකාරය හා වර්ගය හා ඒ බලපත්‍රය යටතේ සිදු කෙරෙන මෙහෙයුම් ප්‍රමාණය පදනම් කරගෙන එම " රාජ්‍යභාග අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය" කාර්යාංශය විසින් නිශ්චය කළ යුතුය.;

(ආ) 'අ' සහ 'ආ' වර්ගවල කාර්මික පතල් කැණීම් බලපත්‍රධාරීන් සහ වෙළඳ බලපත්‍රධාරීන් විසින් සහ අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද විශේෂ අවසරය පිට ඛණිජ ද්‍රව්‍ය අපනයනය කරන අපනයනකරුවන් විසින් මෙහි 14 වැනි ආකෘති පත්‍රය මත සවිස්තර ත්‍රෛමාසික වාර්තාවද සමග අධ්‍යක්ෂවරයා වෙත, ගණන් බලන ලද පරිදි වූ රාජ්‍යභාග ගෙවීම් කළ යුතු ය. අධ්‍යක්ෂවරයා වෙත ත්‍රෛමාසික රාජ්‍යභාග ගෙවීම පහත දැක්වෙන උපලේඛනය ප්‍රකාර කරනු ලැබිය යුතු ය :-

| කාර්තුව | අවසාන වන දිනය | ගෙවිය යුතු අවසන් දිනය |
|---|---|---|
| ප්‍රථම<br>දෙවන<br>තෙවන<br>සිව්වන | මාර්තු 31<br>ජූනි 30<br>සැප්තැම්බර් 30<br>දෙසැම්බර් 31 | අප්‍රේල් 30<br>ජූලි 31<br>ඔක්තෝබර් 31<br>(ඊළඟ වර්ෂයේ)<br>ජනවාරි 31 |

(ඇ) ත්‍රෛමාසික රාජ්‍යභාග ගෙවීමෙහි ලා පැහැර හැරීමක් සිදුවූවහොත්, එම ගෙවීම, ගෙවිය යුතු රාජ්‍යභාගයේ ප්‍රතිශතයකට සමාන, කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන දඩයකට යටත් විය යුතු ය. ;

(ඈ) කිසියම් ලිත් වර්ෂයක් සඳහා ගෙවිය යුතු පැහැර හරින ලද රාජ්‍යභාගය සහ (ඇ) අනුඡේදයේ නිශ්චය කොට දැක්වෙන දඩය ඊළඟට එළඹෙන වර්ෂයේ ජනවාරි 31 වැනි දින දී හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂවරයාට ගෙවනු නොලැබුවහොත්, එම මුදල් සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් ඒ සඳහා කාර්යාංශය විසින් කලින් කල නිශ්චය කරන අනුපාතිකයක් මත පොලිය ගෙවිය යුතු ය.";

(ඇ) ඒ නියෝගයේ (3) වන හා (4) වන ඡේද පිළිවෙලින් එහි (4) වන හා (5) වන ඡේද ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ඈ) එසේ නැවත අංක යෙදූ (4) වන ඡේදයට පෙරාතුවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(3) මේ නියෝගයේ පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, එම පැහැර හරින ලද රාජ්‍යභාග ගෙවීම්, කාර්යාංශය විසින් නිශ්චය කර බලපත්‍රලාභියා වෙත දැනුම් දෙන ලද කාලසීමාවක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවා නිම කරනු නොලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රයක් අලුත් කිරීම, කාර්යාංශය විසින් එහි අභිමතය පරිදි ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය."

(ඉ) ඒ නියෝගයේ (5) වන ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(6) පතල් කළ යුතු ය. සියලු බලපත්‍රධාරියකුගෙන් ඛණිජ ද්‍රව්‍ය මිලදී ගන්නා ගැණුම්කරුවකු විසින්, එම ගැණුම් මිලෙන්, භූ විද්‍යා සමීක්ෂණ හා කාර්යාංශය වෙත රාජ්‍යභාගය ලෙස ගෙවිය යුතු මුදල රඳවා තබාගෙන, එම මුදල කාර්යාංශයට බැර මිල දී ගැනීම් පිළිබඳ විස්තර, කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

11. (i) 34, 35, 36, 37, 38, 39, 40 සහ 41 වන නියෝග, පිළිවෙලින් 35, 36, 37, 38, 39, 40, 41 සහ 42 ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ii) "ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ කුලී" යන ශීර්ෂයට ඉක්බිතිවම පහත දැක්වෙන 34 වන නියෝගය ඇතුළත් කිරීමෙන්.-

"34 (1) අපනයන බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම,

(අ) "අ" හෝ "ආ" වර්ගවල කාර්මික පතල් කැනීම් බලපත්‍රයක් හෝ වෙළඳ බලපත්‍රයක් හෝ දරන්නකු විසින් හෝ ඔහුගේ බලයලත් අනුයෝජිතයා විසින්, කාර්යාංශයේ, කොළඹ පිහිටි ලියාපදිංචි කාර්යාලය වෙත පමණක් පෞද්ගලිකවම ඉදිරිපත් කළ යුතු අතර, ඒ ඉල්ලුම් පත්‍රය මෙහි අංක 15 දරන ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය ;

(ආ) නියමිත ගාස්තුව සමග සහ එම ඛණිජ ද්‍රව්‍ය අපනයනය හා සම්බන්ධ අවශ්‍ය ලේඛන සමග ඉදිරිපත් කළ යුතු ය ;

(2) සෑම අපනයන බලපත්‍රධාරියකු විසින්ම, ඒ බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් ඛණිජ ද්‍රව්‍යයක් වෙනුවෙන් ද, ඒ ඛණිජ ද්‍රව්‍ය, අධ්‍යක්ෂවරයාගේ විශේෂ අවසරය ඇතිව අපනයනය කරනු ලැබිය හැකි ය ;

(3) අපනයන බලපත්‍රයක් එක් මාසයක කාලසීමාවක් සඳහා වලංගු වන අතර, එය පැවරිය නොහැකි විය යුතු ය ;

(4) කලින් නිකුත් කරන ලද යම් අපනයන බලපත්‍රයක් වෙනුවෙන් රාජ්‍යභාග ගෙවීම අපනයන බලපත්‍රධාරියකු විසින් හිඟ තබා ඇති අවස්ථාවක ඒ කලින් බලපත්‍රය මත අයවිය යුතු හිඟ රාජ්‍යභාග සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක්, ඛණිජ-ද්‍රව්‍ය අපනයන බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම කාර්යාංශය විසින් ඉතිරිකර තබා ගත යුතු ය ;

12. නැවත අංක යෙදූ 35 වන නියෝගයේ-

(අ) ඒ නියෝගයේ (1) වන ඡේදයේ "ශිල්පීය කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීම සහ වාර්ෂිකව අලුත් කිරීම-

"අ" වර්ගය............... රු. 1,000/= හෙ
"ආ" වර්ගය............... රු. 250/= හෙ

යන විෂයාංකය වෙනුවට,
"ශිල්පීය කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීම සහ අලුත් කිරීම-

"අ" වර්ගය ............... රු. 2,000/= හෙ
"ආ" වර්ගය............... රු. 1,000/= හෙ

යන විෂයාංකය ආදේශ කිරීමෙන් ;

(ආ) (i) ගවේෂණ බලපත්‍රයක් නිකුත් කිරීම-

පළමු වර්ග කිලෝමීටර් 50 සඳහා රු. 1,000/= හෙ

ඊළඟ වර්ග කිලෝමීටර් 50 සඳහා රු. 1,500/= හෙ

සහ

(ii) ගවේෂණ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා-

පළමු අලුත් කිරීම, (2 වන වර්ෂය අවසානයේ) ව.කි.මී./වාර්ෂික රු. 1,000/=

දෙවන අලුත් කිරීම, (4 වන වර්ෂය අවසානයේ) ව.කි.මී./වාර්ෂික රු. 1,000/=

තුන්වන අලුත් කිරීම (6 වන වර්ෂය අවසානයේ) — ව.කි.මී./වාර්ෂික — රු. 2,000/=

හතරවන (අවසාන) අලුත් කිරීම (8 වන වර්ෂය අවසානයේ) — ව.කි.මී./වාර්ෂික — රු. 3,000/=

යන විෂයාංක වෙනුවට පහත දැක්වෙන විෂයාංක ආදේශ කිරීමෙන්-

"වර්ග කිලෝමීටර් 32 ක් නොඉක්මවන ප්‍රදේශයක් සඳහා ගවේෂණ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා-

පළමු වර්ග කිලෝමීටර් 25 සඳහා ව.කි.මීටරයකට — රු. 3,000/=

ඊළඟ වර්ග කිලෝමීටර් 25 සඳහා ව. කි. මීටරයකට — රු. 6,000/=

සහ

එවැනි ගවේෂණ බලපත්‍රයක් අලුත් කිරීම –

පළමු අලුත් කිරීම (2 වන වර්ෂය අවසානයේ) — ව.කි./මීටරයකට — රු. 6,000/=

දෙවන අලුත් කිරීම - (3 වන වර්ෂය අවසානයේ) — ව.කි.මී./මීටරයකට — රු. 10,000/=

තුන්වන අලුත් කිරීම - (4 වන වර්ෂය අවසානයේ) — ව.කි.මී./මීටරයකට — රු. 20,000/=

"වර්ග කිලෝමීටර 32 ක් ඉක්මවන ප්‍රදේශයක් සඳහා ගවේෂණ බලපත්‍රයක් නිකුත් කිරීම :

පළමු වර්ග කිලෝ මීටර් 32 සඳහා ගවේෂණ බලපත්‍රයක් නිකුත් කිරීම - හෙක්ටයාරයකට - රු. 2,000/=

ඊළඟ වර්ග කිලෝමීටර් 68 ක ප්‍රදේශයක් සඳහා හෙක්ටයාරයකට - රු. 3,000/=

"ගවේෂණ බලපත්‍රයක් අලුත් කිරීම–

පළමු අලුත් කිරීම - ව. කි. මී./වාර්ෂිකව (2 වන වර්ෂය අවසානයේ) - රු. 3,000

දෙවන අලුත් කිරීම – ව.කි.මී./වාර්ෂික (4 වන වර්ෂය අවසානයේ) - රු. 5,000

තුන්වන අලුත් කිරීම - ව.කි.මී./වාර්ෂික (6 වන වර්ෂය අවසානයේ) - රු. 7,500/=

හතරවන අලුත් කිරීම - ව.කි.මී./වාර්ෂික (8 වන වර්ෂය අවසානයේ) - රු. 10,000/=

(ඇ) "කාර්මික පතල් කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම–

"අ" වර්ගය - හෙක්ටයාරයකට – රු. 5,000/=
"ආ" වර්ගය - හෙක්ටයාරයකට – රු. 2,000/=
"ඇ" වර්ගය - හෙක්ටයාරයකට – රු. 1,000/="

යන විෂයාංකය වෙනුවට පහත දැක්වෙන විෂයාංකය ආදේශ කිරීමෙන් :–

"කාර්මික පතල් කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම–

"අ" වර්ගය - හෙක්ටයාරයකට – රු. 15,000/=
"ආ" වර්ගය - හෙක්ටයාරයකට – රු. 5,000/=
"ඇ" වර්ගය - හෙක්ටයාරයකට – රු. 2,500/=

අපනයන බලපත්‍රයක් නිකුත් කිරීම රු. 5,000/=

13. නැවත අංක යෙදූ 37 වැනි නියෝගය ඉවත් කිරීමෙන් ;

14. 38, 39, 40, 41 සහ 42 වන නියෝග 37, 38, 39, 40 සහ 41 ලෙස නැවත පිළිවෙලින් අංක යෙදීමෙන් ;

15. 3 වන නියෝගයේ අංක 1 ආකෘති පත්‍රය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘති පත්‍රය ආදේශ කිරීමෙන් ;

ශිල්පීය කැණීම් බලපත්‍රය - අ/ආ වර්ගය

(යන්ත්‍රෝපකරණ යොදා නොගෙන අතින් කරන කැණීම් සඳහා)

ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම්කරු පිළිබඳ විස්තර :

(i) පුද්ගලයකු සඳහා–

(අ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
(ආ) ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ඇ) සේවා නියුක්තිය හා සේවා යෝජකයාගේ නම :————.
(ඈ) ලිපිනය :————.
(ඉ) දුරකථන අංකය :————. ෆැක්ස් අංකය :————.
(ඊ) ඊ මේල් :————.

(ii) සමාගමක්/හවුල් ව්‍යාපාරයක් සඳහා–

(අ) සමාගමේ / හවුල් ව්‍යාපාරයේ නම :————.
(ආ) ලියාපදිංචි කළ දිනය සහ ව්‍යාපාර ලියාපදිංචි අංකය :————.
(ඇ) ලිපිනය :————.
(ඈ) දුරකථන අංකය :————. ෆැක්ස් අංකය :————.
(ඉ) ඊ මේල් :————.

2. බලපත්‍ර ප්‍රදේශය පිළිබඳ විස්තර :

(අ) ඉඩමේ නම සහ ලොට් අංකය :————.
(ඔප්පුවේ සහ මැනුම් පිඹුරේ පිටපත අමුණන්න.)

(ආ) ඉඩම් හිමියාගේ නම:————.
(ඉල්ලුම්කරුට අයත් නැත්නම්, බද්දු ලේඛනය, ශිවිසුම හෝ කැණීම් කටයුතු සඳහා කැමැත්ත දෙන අයිතිකරුගේ දිවුරුම් පත්‍රය අමුණන්න.)

(ඇ) ඉඩම පිහිටා තිබෙන ගමේ නම :————.
(ඈ) ග්‍රාම නිලධාරී කොට්ඨාශය :————.
(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) පරිපාලන දිස්ත්‍රික්කය :————.

3. ඉල්ලුම් පත්‍රය ගල්වලක් සඳහා නම්-

(අ) කැඩීමට නියමිත ඛණිජ වර්ගයේ (ගල) නම :————.
(ආ) අලුත් ගල්වලක් ද නැතහොත් පරණ ගල්වලක් නැවත ආරම්භ කිරීමක් ද යන වග :————.
(ඇ) පරණ ගල්වලක් විවෘත කිරීමක් නම්, කලින් කැනීම් කටයුතු පිළිබඳ විස්තර :————.
(ඈ) ගල් කඩන ක්‍රමය :————.
(ඉ) බෝර සිදුරක ගැඹුර - අඩි :————.මීටර් :————.
(ඊ) යෝජිත මාසික නිෂ්පාදනය - කියුබ් :————. ඝන මීටර :————.

4. ඉල්ලුම් පත්‍රය වැලි නිධි ගොඩදැමීම හෝ බොරලු හෝ පස් කැපීම සඳහා නම් -

(අ) වැලි ගොඩදැමීම ගංගාවකින් හෝ දොළකින් හෝ භූමියේ පදනම්ව ඇති (වැලලි ඇති) නිධිවලින් හෝ වැලි කඳු වලින් ද යන වග :————.

(ආ) වැලි ලබා ගැනීමට නියමිත ගංගාවේ, ඔයේ හෝ දොළේ නම :————.

(ඇ) වැලි ලබා ගැනීමට යන්නේ ගඟ, ඔය හෝ දොළ පතුලෙන් ද නැතහොත් මතුපිට නිධි වලින් ද :————.

(ඈ) වැලි ගොඩ දමන ක්‍රමය :————.

(ඉ) වැලි ලබා ගන්නේ ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි ප්‍රවේශයකින් නම් එම ප්‍රවේශයේ (තොටුපලේ) නම :————.

(ඊ) ප්‍රවේශය (තොටුපල) පෞද්ගලික එකක් නම්, එය ප්‍රාදේශීය ලේකම්වරයා අනුමත කර තිබේ ද ? :————. (අනුමැතිය අමුණන්න.) :————.

(උ) වැලි, බොරලු හෝ පස් ලබාගන්නේ වලකින් නම් එම වලේ ගැඹුර

(ඌ) මාසිකව ඉවත්කර ගන්නා ප්‍රමාණය කියුබ් :————. ඝන මීටර :————.

5. වෙනත් ඛණිජ ද්‍රව්‍ය සඳහා -

(අ) කැනීමට යන ඛණිජ ද්‍රව්‍ය :————.
(ආ) පූර්වයෙන් යම් කැනීම් කර තිබේද යන වග :————.
(ඇ) කැණීම් සිදුකරන ක්‍රමය :————.
(ඈ) වළක් හෑරීමෙන් හෝ පතල් ළිඳක් බැස්සවීමෙන් යටි බිම් කැනීම් කරන්නේ නම් යෝජිත ගැඹුර සඳහන් කරන්න.
අඩි :————. මීටර :————.
(ඉ) යෝජිත මාසික නිමැයුම් ප්‍රමාණය - කියුබ් :————. ඝන මීටර :————.
(ඊ) කණින ලද ඛණිජ ද්‍රව්‍ය පිරිසැකසුම් කරන්නේ නම්, පිරිසැකසුම් කරන ලද ඛණිජ ද්‍රව්‍ය ශ්‍රේණි සහ අගය එකතු කළ නිෂ්පාදන (ලැයිස්තුව අමුණන්න.) :————.

6. සවිස්තර පතල් ප්‍රතිසංස්කරණ හා ඉඩම් පුනරුත්ථාපන සැලැස්ම (අමුණන්න.) :————.

7. බැඳුම්කරයේ ස්වභාවය සහ අගය :————.

මෙම ඉල්ලුම්පත්‍රයේ ඇතුළත් ප්‍රකාශ, මාගේ උපරිම දැනීම අනුව සත්‍ය බව හා නිවැරදි බව මෙහි පහත අත්සන් කරන මම මෙයින් සහතික කරමි. 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග පිළිපැදීමට මම මෙයින් පොරොන්දු වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි

ශිල්පීය කැණීම් බලපත්‍ර අංකය :————.
බලය දෙන නිලධරයා :————.
අත්සන :————.
දිනය :————.

වලංගු කාල සීමාව :————.
ගෙවිය යුතු රාජ්‍ය භාගය :————.

16. අංක 1 දරන ආකෘති පත්‍රයට ඉක්බිතිව පහත දැක්වෙන ආකෘති පත්‍රය ඇතුළත් කිරීමෙන් –

ශිල්පීය කැණීම් බලපත්‍රය - "අ" හෝ "ආ" වර්ගය

අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රය

(බලපත්‍රයේ කාලය ඉකුත් වන දිනට යටත් පිරිසෙයින් දවස් 30 කට කලින් ඉදිරිපත් කළ යුතු ය.)

1. බලපත්‍රයේ විස්තර :

(අ) බලපත්‍රධාරියාගේ / සමාගමේ නම :———.

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි අංකය :———.

(ඇ) ලිපිනය :———.

(ඈ) බලපත්‍ර වර්ගය හා අංකය :———.

(ඉ) වලංගු කාලය :———. සිට :———. දක්වා

(ඊ) අලුත් කරන වාරය ප්‍රථම/දෙවන/තෙවන/සිව්වන/පස්වන/වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න.) :———.

(උ) බලපත්‍රය යටතේ කණිනු ලබන ඛණිජ ද්‍රව්‍ය :———.

(ඌ) පතල පිහිටි ඉඩමේ නම :———.

(එ) ග්‍රාම නිලධාරී කොට්ඨාශය :———.

(ඒ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.

(ඔ) දිස්ත්‍රික්කය :———.

2 කැනීම් කටයුතු වල විස්තර–

(අ) වර්ෂය ඇතුළත කැණීමේ මෙහෙයුම් සිදුකල දින ගණන :———.

(ආ) සේවක සංඛ්‍යාව :———.

(ඇ) ගල් පිපිරවීම් සිදු කරන ලද නම් බලපත්‍ර කාලය ඇතුළත ලබාගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය (පුපුරණ ද්‍රව්‍ය (ස්වෝටක) බලපත්‍ර පිටපත් අමුණන්න.)

| පුපුරන ද්‍රව්‍ය / බලපත්‍ර අංකය | | | | |
|---|---|---|---|---|
| ඇමෝනියම් නයිට්‍රේට් කිලෝග්‍රෑම් | | | | |
| ජෙලිග්නයිට්/ ඩයිනමයිට් කිලෝග්‍රෑම් | | | | |
| කලු වෙඩි බෙහෙත් කිලෝ ග්‍රෑම් | | | | |

3 කණින ලද, පිරිසැකසුම් කරන ලද, අගය එකතු කරන ලද ඛණිජ ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු හා ඒවායේ වෙළඳපල වටිනාකම–

(අ) පතලෙන්/ගල්වලෙන් කැනීම් කර ඉවත් කර ගත් මුළු ඛණිජ ද්‍රව්‍ය ප්‍රමාණය

| වර්ෂය | කාර්තුව | ප්‍රමාණය කියුබ්/ඝන මීටර්/මෙට්‍රික් ටොන් |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(ආ) පිරිසැකසුම් නොකල, පිරිසැකසුම් කළ, අගය එකතුකල නිෂ්පාදන–

වර්ෂය :—————. කාර්තුව :—————.

| නිෂ්පාදන ශ්‍රේණිය | ප්‍රමාණය කියුබ්/ඝන මීටර්/මෙට්‍රික් ටොන් | මුළු වටිනාකම (රු.) |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| | | |

(ඇ) පිරිසැකසුම් කළ/පිරිසැකසුම් නොකල ඛණිජ ද්‍රව්‍ය අපනයනය පිළිබඳ විස්තර (අදාළ වේනම්) :—————

| ඛණිජ ද්‍රව්‍ය ශ්‍රේණිය | අපනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | වටිනාකම (රු.) |
|---|---|---|
| | | |

(ඈ) පතලේ මුලු නිපැයුම් ප්‍රමාණයේ වෙළෙඳපල වටිනාකම රු. :—————.

(ඉ) පතලේ මුලු නිපැයුම් ප්‍රමාණයේ නිශ්චය කල වටිනාකම රු. :—————.

4. ගෙවිය යුතු රාජ්‍ය භාගය –

(අ) පතලේ නිපැයුම් නිෂ්පාදනවල වෙළෙඳපල වටිනාකම රු. :—————.

(ආ) ගෙවිය යුතු රාජ්‍ය භාගය සියයට ..........% බැගින් රු. :—————.

(ඇ) ප්‍රමාද වූ ගෙවීම් වෙනුවෙන් ගෙවිය යුතු පොලී රු. :—————. එකතුව රු. :—————.

(ඈ) රාජ්‍ය භාගය ගෙවීම (දිනය) :—————.

රිසිට් පත් අංකය :—————.

මෙම ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් ප්‍රකාශ මාගේ උපරිම දැනීම අනුව සත්‍ය බව හා නිවැරදි බව, මෙහි පහත අත්සන් කරන මම මෙයින් සහතික කරමි. 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග පිළිපැදීමට මම මෙයින් පොරොන්දු වෙමි.

—————

ඉල්ලුම්කරුගේ අත්සන.

ශිල්පීය කැණීම් බලපත්‍ර අංකය :—————. වලංගු කාලසීමාව :—————.

බලය දෙන නිලධාරියා :—————. අත්සන :—————.

දිනය :—————.

17. අංක 2.1 ආකෘති පත්‍රයේ -

(1) (අ) ඒ ආකෘති පත්‍රයේ 1 වන ඡේදයේ (ඉ) අනුඡේදයේ " වෘත්තීය" යන වචනය වෙනුවට "සේවා නියුක්තිය සහ සේවායෝජකයාගේ නම " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ආකෘති පත්‍රයේ (ඊ) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් .-

"(උ) ගවේෂණය කිරීම සඳහා මූල්‍යමය හැකියාව ඔප්පු කරන සාක්ෂි (සනාථ කරන ලේඛන අමුණන්න.)"

(ii) ඒ ආකෘති පත්‍රයේ 2 වන ඡේදයේ (ඉ) අනුඡේදයේ (iii) වන විෂයාංකයට ඉක්බිතිවම, පහත දැක්වෙන විෂයාංකය එකතු කිරීමෙන් .-

"(iv) අලුතින් පිහිටුවාගත් සමාගමක් නම්, ගවේෂණ කටයුතු කිරීම සඳහා මූල්‍යමය හැකියාව ඔප්පු කරන සාක්ෂි ඉදිරිපත් කරන්න. (ලේඛන ඇමිණිය යුතු ය.)"

18. අංක 3.1 ආකෘති පත්‍රයේ -

(1) ඒ ආකෘති පත්‍රයේ 2 වන ඡේදයේ (ඉ) අනුඡේදයේ " වෘත්තීය" යන වචනය වෙනුවට "සේවා නියුක්තිය සහ සේවායෝජකයාගේ නම " යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ආකෘති පත්‍රයේ 4 වන ඡේදයේ "තාක්ෂණික /වෘත්තීය දත්ත " යන වචන වෙනුවට "තාක්ෂණික / වෘත්තිය දත්ත" ("අ" සහ "ආ " වර්ග සඳහා පමණකි.) 2" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) ඒ ආකෘති පත්‍රයේ 5 වන ඡේදයේ (ඈ) අනුඡේදයට ඉක්බිතිව, පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් -

" (ඉ) යටි බිම් කැණීමක් නම් පතල් ළිදේ
(ෂාෆ්ට් /වලේ ගැඹුර (අඩි /මීටර්) ...............

(ඊ) පාවිච්චි කරන පුපුරණ ද්‍රව්‍ය (ස්පෝටක ) ..............."

(iv) (අ) ඒ ආකෘති පත්‍රයේ 6 වන ඡේදයේ "බලපත්‍ර දී ඇති ප්‍රදේශයේ පිහිටීම දැක්වෙන සිතියම - (ඉල්ලා ඇති ප්‍රදේශයේ පිළිගත හැකි විස්තරයක් සහ විස්තර සහිත පිහිටීමේ මායිම් දැක්වෙන පිටපත් අමුණන්න. ) " යන වචන වෙනුවට " බලපත්‍ර දී ඇති ප්‍රදේශයේ විස්තර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (අ), (ආ) සහ (ඇ) අනුඡේද, (ඇ), (ඉ) (ඊ) අනුඡේද ලෙස පිළිවෙලින් නැවත අක්ෂර යෙදීමෙන් ;

(ඇ) අලුතින් අක්ෂර යෙදූ (ඇ) අනුඡේදයට පෙරාතුවම පහත දැක්වෙන (අ), (ආ) සහ (ඇ) අනුඡේද ඇතුළත් කිරීමෙන් ;

" (අ) ඉඩමේ නම .- (ඔප්පුවේ සහ මැනුම් පිඹුරේ පිටපතක් අමුණන්න.)

(ආ) ඉඩම් හිමියාගේ නම :—
(ඉල්ලුම්කරුට අයත් නැත්නම් බදු ගිවිසුම හෝ දිවුරුම් පත්‍රයක් අමුණන්න.)

(ඇ) ඉඩම පිහිටා ඇති ගමේ නම :—" ;

19 අංක 3.2 ආකෘති පත්‍රයේ .-

(අ) " කාර්මික පතල් කැණීම් බලපත්‍රය අලුත්කිරීම " යන ශීර්ෂය වෙනුවට " කාර්මික පතල් කැණීම් බලපත්‍රය -'අ' / 'ආ' වර්ගය "අලුත් කිරීමේ ඉල්ලුම් පත " යන ශීර්ෂය ආදේශ කිරීමෙන් .;

(ආ) ඒ ආකෘති පත්‍රයේ (i) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(i) බලපත්‍ර වර්ගය සහ අංකය :...............

(ii) කාලය ඉකුත් වන දිනය :..............."

(ඇ) ඒ ආකෘති පත්‍රයේ 4 වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ;

" 5 ත්‍රෛමාසික පතල් තොරතුරු සාරාංශය ඉදිරිපත් කිරීම.

| වර්ෂය/ කාර්තුව | ඉදිරිපත් කළ දිනය |
|---|---|
| ................. | ................. |
| ................. | ................. |
| ................. | ................. |
| ................. | ................. |

20. අංක 3 : 2 ආකෘතියට ඉක්බිතිවම, පහත දැක්වෙන ආකෘති පත්‍රය ඇතුළත් කිරීමෙන් :

" 5 (1) නියෝගය
3.2 (අ) ආකෘතිය

කාර්මික පතල් කැණීම් බලපත්‍රය " ඇ " වර්ගය

අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රය
( බලපත්‍රයේ කාලය ඉකුත්වීමට යටත් පිරිසෙයින් දවස් 30කට කලින් ඉදිරිපත් කළ යුතු ය.)

1. බලපත්‍රයේ විස්තර ;

(අ) බලපත්‍රධාරියාගේ/ සමාගමේ නම :—
(ආ) ජාතික හැඳුනුම්පත් අංකය /ව්‍යාපාර ලියාපදිංචි අංකය :—
(ඇ) ලිපිනය :—
(ඈ) බලපත්‍ර අංකය :—
(ඉ) වලංගු කාලය ...................... සිට ............දක්වා :—
(ඊ) අලුත් කරන වාරය:— ප්‍රථම/දෙවන /තෙවන/සිව්වන/පස්වන/ වෙනත් ( නිශ්චිතව සඳහන් කරන්න.)...............
(උ) බලපත්‍රය යටතේ කණිනු ලබන ඛනිජ ද්‍රව්‍යය :—
(ඌ) පතල පිහිටි ඉඩමේ නම :—
(එ) ග්‍රාම නිලධාරී කොට්ඨාශය :—
(ඒ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—
(ඔ) දිස්ත්‍රික්කය :—

2. කැණීම් කටයුතු වල විස්තර.-

(අ) වර්ෂය ඇතුළත කැණීම් මෙහෙයුම් සිදු කළ දින ගණන.
(ආ) සේවක සංඛ්‍යාව :—
(ඇ) ගල් පිපිරවීම් සිදු කරන ලද නම්, බලපත්‍ර කාලය ඇතුළත ලබාගත් පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය :— (පුපුරණ ද්‍රව්‍ය (ස්වෝටක )බලපත්‍ර පිටපත් අමුණන්න.)

| | | | | |
|---|---|---|---|---|
| පුපුරණ ද්‍රව්‍ය/බලපත්‍ර අංකය | | | | |
| ඇමෝනියම් නායිට්‍රේට් කිලෝ ග්‍රෑම් | | | | |
| ජෙලිග් නයිට් /ඩයිනමයිට් කිලෝ ග්‍රෑම් | | | | |
| කළු වෙඩි බෙහෙත් | | | | |

(ඈ) ගල්වලෙන් / පතලෙන් කණින ලද ගල් / ඛණිජ ද්‍රව්‍ය සම්පූර්ණ ප්‍රමාණය :—

| වර්ෂය | කාර්තුව | ප්‍රමාණය – කියුබ්/ ඝන මීටර්/මෙට්‍රික් ටොන් |
|---|---|---|
| | | |
| | | |
| | | |

3. පිරිසැකසුම් කළ හා අගය එකතු කළ නිෂ්පාදන :—
වර්ෂය ............... කාර්තුව/ කාර්තු දක්වා

| නිෂ්පාදිත වර්ගය | ප්‍රමාණය – කියුබ්/ඝනමීටර් /මෙට්‍රික් ටොන්/ | මුළු වටිනාකම (රු. ) |
|---|---|---|
| | | |
| | | |
| | | |

වර්ෂය කාර්තුව/කාර්තු :............

| නිෂ්පාදිත වර්ගය | ප්‍රමාණය – කියුබ්/ ඝන මීටර්/ මෙට්‍රික් ටොන්/ | මුළු වටිනාකම (රු.) |
|---|---|---|
| | | |
| | | |
| | | |

4. අපනයනය කළ පිරිසැකසුම් / පිරිසැකසුම් නොකළ ඛනිජ ද්‍රව්‍ය (අදාළ වන්නේ නම් )

| ඛනිජ ද්‍රව්‍ය වර්ගය | අපනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන් ) | වටිනාකම රු. :............ |
|---|---|---|
| | | |

5. සියලු පතල් නිෂ්පාදනවල වෙළෙඳපල වටිනාකම :— රු. ...........

6. සියලු පතල් නිෂ්පාදනවල නිශ්චය කළ වටිනාකම :— රු. ...........

7. ගෙවිය යුතු රාජ්‍ය භාගය

(i) සියලු පතල් නිෂ්පාදනවල වෙළෙඳපල වටිනාකම :— රු. ...........
(ii) සියයට ............% බැගින් ගෙවිය යුතු රාජ්‍ය භාගය :— රු. ...........
(iii) ප්‍රමාද වූ ගෙවීම් වෙනුවෙන් ගෙවිය යුතු පොලිය :— රු. ...........
එකතුව. :— රු. ...........
(iv) ..........දින ගෙවූ රාජ්‍ය භාගය. :— රිසිට් පත් අංකය ............

මෙම ඉල්ලුම්පත්‍රයේ ඇතුළත් ප්‍රකාශ මගේ උපරිම දැනීම අනුව සත්‍ය බව හා නිවැරදි බව මෙහි පහත අත්සන් කරන මම මෙයින් සහතික කරමි. 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග පිළිපදින බවට මම මෙයින් පොරොන්දු වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————

අලුත් කිරීම අනුමත කරමි :—
වලංගු කාලය :—
අධ්‍යක්ෂ විසින් බලයදීම :—

.....................
අධ්‍යක්ෂවරයාගේ අත්සන.

දිනය :————

21. අංක 3.3 දරන ආකෘතිපත්‍රයේ "කාර්මික පතල් කැණීම් බලපත්‍රය" යන ශිර්ෂය වෙනුවට" "කාර්මික පතල් කැණීම් බලපත්‍රය" - 'අ' සහ 'ආ' වර්ගය" යන ශිර්ෂය ආදේශ කිරීමෙන්

22. අංක 4.1 ආකෘති පත්‍රය

(අ) (i) වන ඡේදයේ (ආ) අනුඡේදයේ .-

(i), (ii), (iii), (iv) සහ (v) වන විෂයාංක, පිළිවෙලින් (iii), (iv), (v) සහ (vi) වන විෂයාංක ලෙස නැවත අංක යෙදීමෙන්

(ii) (1) වන අයිතමයට ඉක්බිතිවම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත කිරීමෙන් .-

(ii) ජාතික හැඳුනුම් පත් අංකය ............ පාස් පෝට් අංකය :

(iii) නැවත අංක යෙදූ (V) වන අයිතමයේ "වෘත්තිය" යන වචනය වෙනුවට "සේවා නියුක්තිය සහ සේවායෝජකගේ නම " යන වචන ආදේශ කිරීමෙන්

(ආ) ඒ ආකෘතිපත්‍රයේ 2 වන ඡේදයේ (අ) අනුඡේද ඉවත් කර (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), සහ (ඌ) යන අනුඡේද පිළිවෙලින් (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), අනුඡේද ලෙස නැවත අක්ෂර යෙදීමෙන්

(ඇ) 2 වන ඡේදයේ නැවත අක්ෂර යෙදූ (අ) අනුඡේදයේ "බලපත්‍රය " යන වචනයට ඉක්බිතිවම පහත දැක්වෙන විෂයාංකය ඇතුළත් කිරීමෙන්.-

| ඛනිජ ද්‍රව්‍ය | කැණීම් බලපත්‍ර අංකය | කාලය ඉකුත්වන දිනය |
|---|---|---|
| | | |

(කැනීම් බලපත්‍රය, ඉල්ලුම්පත්‍රයේ දින සිට යටත් පිරිසෙයින් මාස තුනක කාලයක් සඳහා වලංගුව පවතී)

23. අංක 4.2 ආකෘති පත්‍රයේ

(අ) 3 වන ඡේදයේ :—

(i) (අ) අනුඡේදයේ (II), (III), (IV), සහ (V), වන විෂයාංක පිළිවෙලින් (III), (IV), (V) සහ (VI) වන විෂයාංක ලෙස නැවත අංක යෙදීමෙන් ;

(II) (I), වන විෂයාංකයට ඉක්බිතිවම පහත දැක්වෙන විෂයාංකය ඇතුළත් කිරීමෙන් .-

"(II) ජාතික හැඳුනුම්පත් අංකය :..................

පාස්පෝට් අංකය :..................";

(III) (අ) අනුඡේදයේ නැවත අංක යෙදූ (V) වන විෂයාංකයේ "වෘත්තිය" යන වචනය වෙනුවට "සේවා නියුක්තිය සහ සේවායෝජකයාගේ නම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ආකෘති පත්‍රයේ (4) සහ (5) වන ඡේද පිළිවෙලින් එහි (5) සහ (6) වන ඡේද ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ඇ) ඒ ආකෘති පත්‍රයේ (3) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ;

"(4) බලපත්‍රය යටතේ වෙළෙඳාම් විස්තර ";

(අ) මිලදී ගත් ඛණිජ ද්‍රව්‍ය

| ඛණිජ ද්‍රව්‍ය | මිලදී ගන්නා ලද්දේ කාගෙන් ද (බලපත්‍ර අංකය සඳහන් කරන්න) | ප්‍රමාණය කියුබ්/ඝන මීටර්/ මෙට්‍රික් ටොන් |
|---|---|---|
| | | |

(ආ) විකුණුම්/පිරිසැකසුම් කළ / පිරිසැකසුම් නොකළ ඛනිජ ද්‍රව්‍ය අපනයන

| ඛනිජ ද්‍රව්‍ය වර්ගය | විකුණුම් ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | අපනයන ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | වටිනාකම රු. ............ |
|---|---|---|---|
| | , | | |

24. අංක 5 ආකෘතිපත්‍රයේ –

(අ) ඒ ආකෘති පත්‍රයේ (I) වන ඡේදයේ :—

(I) (I) වන ඡේදය ඒ ඡේදයේ (I) වන අනුඡේදය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(II) (I) වන ඡේදයේ (I) වන අනුඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් ;

"(II) ජාතික හැඳුනුම්පත් අංකය / පාස්පෝට්

අංකය ..................." :

(ආ) (i) ඒ ආකෘති පත්‍රයේ (3) වන ඡේදයේ

"බලපත්‍ර ලත් ප්‍රදේශීය නිශ්චයන සිතියම (ඉල්ලා සිටින ප්‍රදේශය පිළිබඳව පිළිගත හැකි විස්තරයක් සහ මායිම් සත් වැටවල පිහිටීමේ විස්තරය අමුණන්න.)" යන වචන වෙනුවට "බලපත්‍රලත් ප්‍රදේශයේ විස්තර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (අ) හා (ආ) අනුඡේද (ඇ) සහ (ඉ) ලෙස නැවත අක්ෂර යෙදීමෙන් ;

(iii) (ඇ) අනුඡේදයට පෙරාතුවම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් ;

"(අ) ඉඩමේ නම .............
(ඔප්පුවේ සහ මැනුම් පිඹුරේ පිටපතක් අමුණන්න.);

(ආ) ඉඩම් හිමියාගේ නම .......
(ඉල්ලුම්කරුට අයත් නැත්නම්, බදු කැමැත්ත, ගිවිසුම හෝ දිවුරුම් පත්‍රයක් අමුණන්න.);

(ඇ) ඉඩම පිහිටා ඇති ගමේ නම ........." ;

(iv) (ඉ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් ;
"(ඊ) පරිපාලන දිස්ත්‍රික්කය."

(ඇ) ආකෘති පත්‍රයේ 7 වන ඡේදයේ–

(i) (අ) අනුඡේදයේ, "කටයුතු කල " යන වචන වෙනුවට "වර්ෂය ඇතුළත කටයුතු කළ දින ගණන " යන වචන ආදේශ කිරීමෙන්.

(ii) (ඇ) අනුඡේදයේ "නිස්සාරණය කළ " යන වචන වෙනුවට " පිරිසැකසුම් කළ "යන වචන ආදේශකිරීමෙන් ;

25. අංක 7 ආකෘති පත්‍රයේ –

(අ) ඒ ආකෘති පත්‍රයේ I ඡේදය –

(i) ඒ ඡේදය එහි (අ) අනුඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන් ;

(ii) නැවත අක්ෂර යෙදු (අ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් .–

"(ආ) ජාතික හැඳුනුම්පත් අංකය / පාස්පෝට්

අංකය ................."

(ආ) ඒ ආකෘති පත්‍රයේ "කැණීම් බලපත්‍ර අංකය" යන වචන වෙනුවට "ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය හා සම්බන්ධ කැණීම් බලපත්‍රයේ අංකය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ ආකෘතිපත්‍රයේ 4 වන ඡේදයේ "වෙළඳ බලපත්‍ර අංකය" යන වචන වෙනුවට, "ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය හා සම්බන්ධ වෙළඳ බලපත්‍ර අංකය" යන වචන ආදේශ කිරීමෙන්" ;

(ඇ) (i) ඒ ආකෘති පත්‍රයේ "පතලේ විස්තරය" යන වචන වෙනුවට "ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය කරනු ලබන්නේ යම් පතලකින්ද ඒ පතලේ විස්තර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ආකෘති පත්‍රයේ එම ඡේදයේ (අ) අනුඡේදයේ "විස්තරය" යන වචන වෙනුවට "නම" යන වචන ආදේශ කිරීමෙන්

(ඉ) ඒ ආකෘතිපත්‍රයේ 10 වන ඡේදයේ "ගබඩාව" යන වචනය වෙනුවට "ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය කරනු ලබන්නේ යම් ගබඩාවකට ද ඒ ගබඩාව" යන වචන ආදේශ කිරීමෙන් ;

26. අංක 8 ආකෘති පත්‍රයේ -

(අ) "ද්විවාර්ෂික තාක්ෂණික වැඩ වාර්තාව" යන ශීර්ෂය වෙනුවට "ද්විවාර්ෂික /වාර්ෂික වැඩ වාර්තාව" යන ශීර්ෂය ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ආකෘති පත්‍රයේ I වන ඡේදයේ "දෙවර්ෂය" යන වචනය වෙනුවට "බලපත්‍ර කාලසීමාව (වර්ෂය /වර්ෂ සඳහන් කරන්න.)" යන වචන ආදේශ කිරීමෙන් ;

27. අංක 10 ආකෘති පත්‍රයේ, "ආර්ථික ජීව්‍යතා වාර්තාව - ආකෘතිය හා අන්තර්ගත කරුණු" යන උප ශීර්ෂය වෙනුවට "ආර්ථික ජීව්‍යතා වාර්තාව - ආකෘතිය හා අන්තර්ගත කරුණු ('අ' සහ 'ආ' වර්ග සඳහා පමණකි.) යන උප ශීර්ෂය ආදේශ කිරීමෙන් ;

28. අංක 11 ආකෘති පත්‍රයේ -

(අ) "කාර්මික පතල් කැණීම් බලපත්‍රය" යන ශීර්ෂය වෙනුවට "කාර්මික පතල් කැණීම් බලපත්‍රය ( 'අ' සහ 'ආ' වර්ග සඳහා පමණකි )" යන ශීර්ෂය ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ආකෘතිපත්‍රයේ 1 වන ඡේදයට පෙරාතුවම පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් ;
"(එක් එක් කාර්තුව අවසාන වීමෙන් පසු දවස් පහළොවක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.)";

(ඇ) ඒ ආකෘති පත්‍රයේ 1 වන ඡේදයේ "බලපත්‍ර අංකය" යන වචන වෙනුවට "බලපත්‍ර අංකය සහ වර්ගය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ ආකෘති පත්‍රයේ 3 වන ඡේදයේ (අ) අනු ඡේදයේ (III) වන විෂයාංකයේ "මෙහෙයුම් සිදු වූ" යන වචන වෙනුවට "කාර්තුව ඇතුළත මෙහෙයුම් සිදු වූ"යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ ආකෘති පත්‍රයේ 3 වන ඡේදයේ (ඇ) අනුඡේදයේ -

(I) (I), (II), (III), (IV), (V) සහ (VI) වන විෂයාංක, පිළිවෙලින් (II), (III), (IV), (V), (VI) සහ (VII) වන විෂයාංක ලෙස නැවත අංක යෙදීමෙන්,

(II) නැවත අංක යෙදූ (ii) වන විෂයාංකයට පෙරාතුවම, පහත දැක්වෙන විෂයාංකය එකතු කිරීමෙන්,

"(1) පුපුරන ද්‍රව්‍ය (ස්වෝටක ) පාවිච්චියට ගත් ප්‍රමාණ පිළිබඳ විස්තර.
(පුපුරන ද්‍රව්‍ය බලපත්වල පිටපත් අමුණන්න.)

(III) '(ඇ)' අනුඡේදයේ නැවත අංක යෙදූ (II) වන විෂයාංකයේ "ටොන් ගණන" යන වචන වෙනුවට "ප්‍රමාණය (කියුබ්/ඝන මීටර් මෙට්‍රික් ටොන්)" යන වචන ආදේශ කිරීමෙන් ;

(IV) "(ඇ) අනුඡේදයේ, නැවත අංක යෙදූ (IV) වන විෂයාංකයේ "කන්සෙන්ට්‍රේට්/ ස්ටොක් පයිල්/ වේස්ට් / ටේලිස් ටොන් ගණන" යන වචන වෙනුවට "ඛනිජ ද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම පිළිබඳ විස්තර (පිරිසැකසුම් කළ "ඛනිජ ද්‍රව්‍ය ගණ හා ප්‍රමාණ ලැයිස්තුව අමුණන්න.)" යන වචන ආදේශ කිරීමෙන් ;

(V) (ඇ) අනුඡේදයේ නැවත අංක යෙදූ (V) වන විෂයාංකය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන විෂයාංකය ආදේශ කිරීමෙන්.-

(VI) විකුණුම් තොරතුරු (පහත දැක්වෙන ආකෘතියට අනුව ලැයිස්තුවක් අමුණන්න.)

| පිරිසැකසුම් කළ ඛනිජ ද්‍රව්‍ය වර්ගය | විකුණූ ප්‍රමාණය | අපනයනය කළ ප්‍රමාණය | විකුණුම්වල/අපනයනවල වටිනාකම | ගැණුම්කරුගේ නම |
|---|---|---|---|---|
| | | | | |

29 අංක 13 ආකෘති පත්‍රයේ -

(අ) ඒ ආකෘති පත්‍රයේ 3 වන ඡේදයේ "වෙළෙඳ බලපත්‍ර අංකය" යන වචන වෙනුවට, "වෙළඳ බලපත්‍ර අංකය සහ ශ්‍රණය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ආකෘති පත්‍රයේ 4 වන ඡේදයේ, "ඛනිජ ද්‍රව්‍යයේ නම" යන වචන වෙනුවට "අලෙවි කළ ඛනිජ ද්‍රව්‍යයේ /ද්‍රව්‍යවල නම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ ආකෘති පත්‍රයේ, 5 වන ඡේදයේ, "ඛණිජ ද්‍රව්‍ය ප්‍රමාණය" යන වචන වෙනුවට "ඛනිජ ද්‍රව්‍ය ප්‍රමාණය" (අලෙවි කළ සියලු ඛනිජ ද්‍රව්‍ය පිළිබඳව ඉල්ලා ඇති විස්තර පහත දැක්වෙන චක්‍රයට අනුව, සපයන්න.)" යන වචන ආදේශ කිරීමෙන් ";

30. අංක 14 ආකෘති පත්‍රයේ .-

(අ) ඒ ආකෘති පත්‍රයේ, 3 වන ඡේදයේ :

(i) "ශිල්පීය කැණීම්" යන වචන වෙනුවට "ආරක්ෂිත ඛනිජ ද්‍රව්‍ය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ආකෘති පත්‍රයේ, 7 වන ඡේදයේ (අ) අනුඡේදය ඉවත් කර, (ආ) අනු ඡේදය (අ) අනුඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන් ;

(ඇ) අලුතින් අක්ෂර යෙදූ (අ) අනු ඡේදයේ "මිලදී ගැනීමේ හා ප්‍රවාහන" යන වචන වෙනුවට "මිළදී ගැනීමේ" යන වචන ආදේශ කිරීමෙන් ;

31. අංක 14 ආකෘති පත්‍රයට ඉක්බිතිවම, පහත දැක්වෙන අංක 15 ආකෘති පත්‍රය ඇතුළත් කිරීමෙන් .-

අපනයන බලපත්‍ර ඉල්ලුම් පත්‍රය

අංක 15 ආකෘති පත්‍රය
34 වන වගන්තිය

1. ඉල්ලුම්කරුගේ නම :
2. ලිපිනය :
3. ගැණුම්කරුගේ නම සහ ලිපිනය :
4. අපනයනය කරන ඛණිජ ද්‍රව්‍යයේ නම, වර්ගය, සහ ප්‍රමාණය :
5. ඉන්වොයිසි අගය :
6. නැවතෙක් නොමිලේ (නැ. තෙ. නො. ) මිල - විදේශ ව්‍යවහාර මුදලින් හා ශ්‍රී ලංකා රුපියල් වලින් :
7. ශ්‍රී ලංකා විනිමය අනුපාතිකය :
8. නැවේ නම :
9. නව පැමිණෙන දිනය :
10. ඇසුරුම් විස්තර :
11. ඛනිජ ද්‍රව්‍ය ගබඩා කර ඇති ස්ථානයේ ලිපිනය :
12. ඛනිජ ද්‍රව්‍යය සැපයුමේ ප්‍රභවය ( මිලදී ගැනීමෙන් ද නැතහොත් තමන්ගේම පතලකින්ද යන වග) :
13. ඛණිජ ද්‍රව්‍ය පිරිසැකසුම් කර තිබේද යන වග (අර්ධ වශයෙන් නිමහම් කළ හෝ පූර්ණ වශයෙන් නිමහම් කළ නිෂ්පාදනවලට බද්ද කර තිබේද ?) :
14. ඉල්ලුම්කරුට මීට කළින් නිකුත් කළ අපනයන බලපත්‍රයේ දිනය :
15. රාජ්‍ය භාගය සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කර තිබේද ? :
16. එසේ ගෙවා බේරුම් කර නොමැති නම්, කලින් අපනයන බලපත්‍රය මත ගෙවිය යුතු හිඟ මුදල :

ඉල්ලුම්කරුගේ අත්සන.
දිනය :

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි</u>

අපනයන බලපත් අංකය :
බලය දෙන නිලධරයා :
අත්සන :

බලපත්‍රය වලංගුකාලසීමාව :
ගෙවිය යුතු රාජ්‍ය භාගය :
දිනය :

11 - 504

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී